# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2332/39 – 2023 මැයි මස 19 වැනි සිකුරාදා – 2023.05.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2023 අංක 60 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/2/2016/HA/88.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ATU/LAD/04/DO46.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 අප්‍රේල් මස 10 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.** – ප්‍රාදේශීය ලේකම්, අතුරලිය.

2. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 314-ඉහළ අතුරලිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අතුරලිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක මාර 2818 ඉඩම් විස්තර ලැයිස්තුවෙහි පිටු අංකය 1 හා 2020.11.04 දිනැති ප්‍රගමන අවසාන ගම් පිඹුරේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 1 – අම්බලන්ගොඩැල්ල – ප්‍රමාණය: හෙක්. 0.0152**

උතුරට: අතුරලිය ශ්‍රී නිවාසාරාමය හිමිකම් කියන අම්බලන්ගොඩැල්ල; නැගෙනහිරට: අතුරලිය ශ්‍රී නිවාසාරාමය හිමිකම් කියන අම්බලන්ගොඩැල්ල සහ මාර්ගය; දකුණට: මාර්ගය, අතුරලිය ශ්‍රී නිවාසාරාමය හිමිකම් කියන අම්බලන්ගොඩැල්ල සහ මාර්ගය (පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය); බටහිරට: අතුරලිය ශ්‍රී නිවාසාරාමය හිමිකම් කියන අම්බලන්ගොඩැල්ල සහ මාර්ගය (පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය).

EOG 05 - 0145



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2023 අංක 64 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2022/BA/245.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: PVL/DS/LND/II/SLE/10.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්,* එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 මැයි මස 09 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි. –** ප්‍රාදේශීය ලේකම්, පොතුවිල්.

2. **ඉඩමේ විස්තරය.–** නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පනමපත්තු සුළු කොට්ඨාසයේ, පොතුවිල්-06 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සහ සින්නපුතුකුඩිරුප්පු ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක AM/POT/2023/105 හා 2023.03.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – විසරමුනෙයි වෙල්ලඩුවකාඩු – ප්‍රමාණය: හෙක්. 0.3733**

උතුරට: හි. පි. 263760 හිමිකම් කියන්නා නොදන්නා විසරමුනෙයි වෙල්ලඩුවකාඩු; නැගෙනහිරට: මූ. පි. අම් 4883 හි කැබලි අංක 1 (අනුරේඛන අංක AM/POT/2021/181 හි කැබලි අක්ෂර G); දකුණට: මූ. පි. අම්2431 හි කැබලි අංක 1 (අනුරේඛන අංක AM/POT/2021/181 හි කැබලි අක්ෂර K) මූ. පි. අම් 4883 හි කැබලි අංක 2 (අනුරේඛන අංක AM/POT/2021/181 හි කැබලි අක්ෂර J); බටහිරට: හි. පි. 262777 හි කොටසක් පූජ්‍ය මඩවල උපාලි හිමි හිමිකම් කියන විසරමුනෙයි වෙල්ලඩුවකාඩු වත්ත.

EOG 05 - 0146

---

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

මගේ යොමු අංකය: 4-3/15/2015/VE/05.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: AMB/LD/01/AQ/54-iv.

අංක 2045/44 හා 2017.11.17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 2A පිටුවෙහි භාෂාත්‍රයෙන් පළකරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාවේ ඉඩමේ විස්තරයෙහි,

අංක ජීජ්/ඒඑම්බී/2015/190 දරන ප්‍රගමන අනුරේඛනයේ දිනය ''2015.09.25'' යන්න ''2015.09.29'' ලෙස නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 අප්‍රේල් මස 10 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 05 - 0147

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.